# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2054/54 - 2018 ජනවාරි මස 19 වැනි සිකුරාදා - 2018.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76අ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (1) ව්‍යවස්ථාව අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මැතිවරණ කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු බැවින් ද 2012 අංක 22 දරන පනතින් සංශෝධිත 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76 අ වගන්තිය අනුව ඡන්ද විමසීම පැවැත්වීමට ඇති බාධා ඉවත් කර ගැනීම පිණිස මැතිවරණ කොමිෂන් සභාව විසින් විධාන පැනවීමට හැකි හෙයින්ද මැතිවරණ කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන විධාන, නියම කොට පනවනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**01. ඡන්ද මධ්‍යස්ථාන තුළ ඡායාරූප ගැනීම සහ වීඩියෝ කිරීම.**

තැපැල් ඡන්ද සලකුණු කිරීමේ මධ්‍යස්ථාන තුළ හෝ ඡන්ද මධ්‍යස්ථාන තුළ ඡන්දය සලකුණු කිරීමේ අවස්ථා හෝ සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකා ඡායාරූපගත කිරීම, වීඩියෝගත කිරීම සහ ඡන්දය සලකුණු කිරීමේ හෝ සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවල හෝ ඡායාරූප මුද්‍රිත, විද්‍යුත් හෝ සමාජ ජාල යනාදී කිසිම මාධ්‍යයක් හරහා බෙදාහැරීම හෝ ප්‍රසිද්ධ කිරීම තහනම් බව මෙයින් නියමකොට නිවේදනය කරනු ලැබේ.

ඡන්ද විමසීම පැවැත්වීමට අදාළ නිල වාර්තා සහ ඡායාරූප රැස්කිරීමේ කාර්යය උදෙසා ඡන්ද මධ්‍යස්ථානයක විශේෂ අවස්ථාවක් හෝ ඡන්ද මධ්‍යස්ථානවල ක්‍රියා පිළිවෙල හෝ ඡායාරූපගත කිරීමේ නැතහොත් වීඩියෝගත කිරීමේ අවශ්‍යතාවක් ඇත්නම් ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් ලිඛිත අවසරයක් ලබා දෙනු ඇති බවද මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

එන්. ජේ. අබේසේකර
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

එස්. රත්නජීවන් එච්. හූල්
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

2018 ජනවාරි මස 19 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

02- 520

1A - PG 3910 — 157 (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*